# ලංකා ඉතිහාසය

## 5.2 දේශපාලන හා මානව චින්තාවලියේ වර්ධනය



මෙම ඒකකය අධ්‍යයනය කිරීමෙන් ඔබට පහත දෑ පිළිබඳ අවබෝධයක් ලබාගත හැකි වනු ඇත

- ආගමික චින්තනයේ වර්ධනය
- ඉන්දියාවේ වර්ධනය වූ නව ආගමික චින්තා
  (බ්‍රාහ්මණවාදය , ජෛනාගම , බෞද්ධාගම)
- ඉන්දියාවේ සමකාලීන වෙනත් ආගමික චින්තා
  (පූර්ණ කස්සප , මක්ඛලී ගෝසාල , අජිත කේසකම්බලී , පකුධ කච්චායන , සංජය බෙල්ලට්ඨිපුත්ත)
- නව ආගමික චින්තනය දේශපාලනය කෙරෙහි බලපෑ අයුරු
- නව ආගමික චින්තනය මානව සමාජය කෙරෙහි බලපෑ අයුරු

නිපුණතාව :-

ඉන්දීය ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි

නිපුණතා මට්ටම :- 5.2

ආගමික හා දාර්ශනික චින්තනය ඉන්දීය ශිෂ්ටාචාරය ගොඩනැගීමට දායක වී ඇති ආකාරය විමර්ශනය කරයි

ඉගනුම් ඵල :-

- ඉන්දියාවේ වර්ධනය වූ නව ආගමික චින්තන හඳුන්වා දෙයි
- නව ආගමික චින්තන දේශපාලනය කෙරෙහි බලපෑම පෙන්වා දෙයි
- නව ආගමික චින්තන මානව සමාජය කෙරෙහි බලපෑ ආකාරය පෙන්වා දෙයි

අන්තර්ගතය :- නන්දනී සෙනවිරත්න මිය , ලක්දාස ද මැල් විද්‍යාලය, කුරුණෑගල.
සැකසුම :- එස්. එච්. දිනුෂා හර්ෂණී කරුණාසේන මිය. ජාතික තරුණ සේවා සභාව. ( 2017-2018 )
අන්තර්ගතය පරීක්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ
Copyright © www.e-thaksalawa.moe.gov.lk

# ආගමික චින්තනයේ වර්ධනය

ඉන්දියානු පුරාවිද්‍යාඥයින් කරන ලද පුරාවිද්‍යාත්මක ගවේෂණවල ප්‍රතිඵල වශයෙන් සොයා ගන්නා ලද විවිධ මානව හා සත්ත්ව රූප නිරූපිත ශිලාමය හෝ ලෝහමය කුඩා සටහන් , මුද්‍රා පලක රාශියක් හමුව ඇත.

මේවා පදනම් කොටගෙන ඉන්දුනිම්න වාසින්ගේ ආගමික ජීවිත පිළිබඳ ඇතැම් තොරතුරු අනුමාන වශයෙන් ඉදිරිපත්ව තිබේ. ඒ අනුව ඉන්දියාවේ ඓතිහාසික යුගයේ සිට වර්තමානය තෙක් පැවත එන ඇතැම් ආගමික විශ්වාසවල සේයාවක් අවුරුදු පන්දහසකට පෙර ජීවත් වූ මේ වැසියන්ගේ ආගමික විශ්වාසවල දක්නට ඇතැයි ඉතිහාසඥයෝ පෙන්වා දෙති.

ඉන්දුනිම්න ආගමික ශිෂ්ටාචාර ඉන්දියාවට ම අනන්‍ය වූ පැරණි ආගමික විශ්වාස ලෙස සැලකිය යුතු බව ඉතිහාසඥයන්ගේ මතය යි.

මේ ශිෂ්ටාචාරයෙන් පසු ඉන්දියානු ආගමික විශ්වාසවල සටහන් දක්නට ලැබෙන්නේ වෛදික සාහිත්‍යයේ ය.

ක්‍රි.පූ. දෙවන සහශ්‍රයේ මුල් භාගයේ සිට වයඹදිග ඉන්දියාවට වරින් වර සංක්‍රමණය වූ ගෝත්‍ර ජන කොටස්වලින් සමන්විත ව හැඩ ගැසුණු ඉන්දු ආර්ය පූජකවරුන් විසින් වාචිකව පවත්වාගෙන එන ලද ස්තෝත්‍ර ගීතිකා ඇතුළත් ප්‍රථම සංග්‍රහය වූ ඍග් වේදය ( ක්‍රි.පූ. 1500-1000 කාලය) කාව්‍යමය සංස්කෘතික භාෂාවෙන් රචිත ශ්ලෝක 1028 කින් සමන්විත ය.

ඍග්වේදයේ ඉපැරණි ඉන්දු ආර්යයන්ගේ ආගමික විශ්වාස හා පුදපූජා ගැන තොරතුරු සඳහන් වේ.

- ස්වභාව ධර්මයේ විවිධ වස්තූන්ට හා අවස්ථාවන්ට දේවත්වය ආරෝපණය කොට තම පූජාවට හා ප්‍රභූන්ට ආරක්ෂාව හා ලෞකික අභිවෘද්ධිය ලබා දෙන ලෙස හඬ නඟා ගායනා කරන ස්තෝත්‍ර හා ගීතිකාවන් ය.
- පරිසරයේ වස්තූන්ට දේවත්වය ආරෝපණය කර තිබුණි. (අග්නි , සූර්ය , ඌෂා , වායු , පෘථිවි )
- ඍග් වේදයට පසු පූජකයින් හඬ නගා කියන ගද්‍ය සූත්‍ර පාඨ ඇතුළත් යජුර් වේද නමින් දෙවන වේදයක් පහළ විය.
- ඔවුන් ගායනා කළ ශ්ලෝක සංග්‍රහ කොට සාම වේද නමින් පසු කලෙක තෙවන වේදයක් ද බිහිවිය.
- වේදත්‍රය ව්‍යවහාරයට පැමිණ කලක් ගත වූ පසු යන්ත්‍ර මන්ත්‍ර හා ඇතැම් දාර්ශනික ශ්ලෝක සූත්‍ර එක් රැස්කොට අථර්වන් නමින් සිව්වන වේදයක් සකස් විය.
- ඍග් වෛදික යුගයේ පැවති යාඥා බෙහෙවින් සරල විය.

අන්තර්ගතය :- නන්දනී සෙනවිරත්න මිය , ලක්දාස ද මැල් විද්‍යාලය, කුරුණෑගල.
සැකසුම :- එස්. එච්. දිනූෂා හර්ෂණී කරුණාසේන මිය. ජාතික තරුණ සේවා සභාව. ( 2017-2018 )
අන්තර්ගතය පරීක්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ
Copyright © www.e-thaksalawa.moe.gov.lk

* කල් යාමේ දී යාගය වඩාත් සංකීර්ණ විය. එහිදී විවිධ අංශවල විශේෂතා ඉසිලූ පූජකයෝ ප්‍රමුඛස්ථානයේ වූහ. ඔවුහු සෝම පානය සකස් කොට යාතිකා ගායනය කොට ගිනි මොලවා දෙවියන්ට ආහාර හා සෝම පානය පිළිගන්වති. දෙවියන් නොපෙනී බලා සිටිද්දී දෙවියන් වෙනුවෙන් ඒවා අනුභව කරති. යාගය සඳහා වියදම් කළ ගෝත්‍රික ප්‍රභූවරුන්ට දිර්ඝායුෂ ධන සම්පත්තිය වීර පුතුන් ලබා දෙන්නැයි යාඥා කෙරිණි.

තවත් කල් යාමේ දී යාගය තවදුරටත් සංකීර්ණ විය. කාලය , පෘථිවි මාතාව හා බ්‍රහ්මන් වෙත ආයාචනා කරනා ශ්ලෝක අථර්වන් වේදයේ එයි.

පෘථිවි මාතාව හා බ්‍රහ්මන් මුණ ගස්වන සංකේතයක් බඳු යුපස්තම්භය යාග භූමියේ සිටවන ලදී.මුල් කාලයේ ගිතෙල් හා ආහාර වෙනුවට විවිධ ගණයේ සතුන් සිය දහස් ගණන් කණුවල බැඳ මරා දෙවියන්ට බිලි පූජා කෙරුණි.

රජෙකු තම පාලනය ආරම්භ කළේ **රාජසෘත** නැමති මහා පරිමාණ බිලි පූජා සහිත යාගයකිනි.

ක්‍රි.පූ. 900 තරමේ සිට උතුරු ඉන්දියාවේ ආර්ය ජන කණ්ඩායම් අතර බ්‍රාහ්මණ ග්‍රන්ථවල එන ධර්ම මුල් බැස තිබුණි.එකල බ්‍රාහ්මණයන් දෙවියන්ට වඩා ප්‍රබල තත්ත්වයකට පත් වූහ. බමුණෝ රජවරුන්ට වඩා ප්‍රබල වූහ. සාර්ථකව යාගහෝම පැවත්වීම සඳහා රජවරුන්ගෙන් සිටුවරුන්ගෙන් සුවිශාල පුද පඬුරු අපේක්ෂා කෙරිණ. මෙසේ දහස් ගණන් ගවයන් රන් රිදී වැනි අගනා භාණ්ඩ හා භවභෝග සම්පත්තියෙන් ආඪ්‍ය වූ බ්‍රාහ්මණයෝ සමාජයේ ප්‍රබල ජන කොටසක් බවට පත් වූහ.

පවිත්‍ර ජන්මය අවධාරණය කළ බමුණෝ වේද අධ්‍යයනයෙහි නියැලෙමින් අතිදුෂ්කර ව්‍රත පුරමින් වෙන ම සමාජ ස්තරයක් ලෙස ප්‍රකට වූ.පොදු ජනතාවගේ සිත් සතන් තුළ භය සම්ප්‍රයුත්ත භක්තියක් ජනනය කිරීමට සමත් වූහ.මේ හේතු කරගෙන තම රටවැසියා පාලනය කිරීමේ දී පාලකයන්ට බමුණන්ගේ සහය අත්‍යවශ්‍ය විය.මේ අනුව රණකාමී පාලකයන් හා බ්‍රාහ්මණයන් අතර සහසම්බන්ධතාව වර්ධනය විය. මෙසේ ක්ෂත්‍රීය හා බ්‍රාහ්මණ යන පන්ති දෙක සමාජයේ උපරිම තල බවට පත් විය.

කෘෂිකර්මය , සත්ත්ව පාලනය , වෙළෙඳාමේ නිරත වූ ආර්ය ජන කොටස් වෛශ්‍ය නමින් හැඳින්විය. ඔවුන් තුන්වන සමාජ ස්තරය බවට පත් විය.එම සමාජ ස්තර තුනට ඇතුළත් නොවූ විවිධ බැලමෙහෙවර , කසළ ශෝධනය වැනි සේවා කටයුතුවල නියැලී සිටි පන්තිය ශුද්‍ර නමින් හැඳින්විය.

Copyright © www.e-thaksalawa.moe.gov.lk



Copyright © www.e-thaksalawa.moe.gov.lk

චතුර් වර්ණ අතරින් උපරිම තලයේ වූ බ්‍රාහ්මණ හා ක්ෂත්‍රිය වර්ණ දෙකේ ජනතාවගේ ජීවන රටාවේ අවධි 4 ක් හැඩගැසෙමින් පැවතුණි.

- 01 බ්‍රහ්මචාරී
- 02 ගෘහස්ත
- 03 වානප්‍රස්ථ
- 04 සන්‍යාසි



ගිහිගෙය හැර දමා වනගතව තවුස්දම් පිරූ අය සමාජ චාරිත්‍රාදියෙන් බැහැරව අධ්‍යාත්මය පිරිසිදු කර ගනිමින් සත්‍ය ගවේෂණ සඳහා අනුගමනය කළ චින්තන විධි සංග්‍රහ කොට ආරණ්‍යක නමින් වෙන ම සාහිත්‍යක් ගොනු විය.

ආරණ්‍යක සාහිත්‍යයෙන් අවධාරණය වූයේ යාග හෝම වැනි බාහිර පුද පූජා ක්‍රමවලට වඩා ආධ්‍යාත්මික පාරිශුද්ධතාව පිළිබඳ ෂඩ් දාර්ශනික සංකල්පනා ය. භාවනානුගත යෝගීන් විසින් ගොනු කරගන්නා ලද ඒ සංකල්පනා තියුණු පරීක්ෂාවකින් පසු තෝරා ගත් ශිෂ්‍යන්ට පමණක් දිය යුතු රහස් සේ රැක ගන්නා ලදී. ඒවා ගොනු කර ආරණ්‍යක සාහිත්‍ය ග්‍රන්ථවල නිගමන කාණ්ඩ ස්වරූපයෙන් උපනිෂද් යනුවෙන් තව ද පරිවාර සාහිත්‍යයක් විය.

ආචාර්යවරයා සමීපයේ හෙවත් උපනිශ්‍රයේ සිට උගත යුතු යන අරුතින් උපනිෂද් යනුවෙන් ව්‍යවහාරයට පත් මෙම ග්‍රන්ථවල ඉහත සඳහන් යාගහෝම පුදපූජා මාර්ගය හෙවත් කර්ම මාර්ගය වඩා අවබෝධ කරගැනීම හෙවත් ඥාන මාර්ගය උසස් සේ සලකන ලදී. මේ අනුව ක්‍රමයෙන් දේශපාලන , ආර්ථික , සමාජයීය රටාවන්ගේ ඇති වූ ප්‍රබෝධය නිසා බ්‍රාහ්මණ නිර්මාණවාදයෙන් බැහැර වී කර්ම මාර්ගය වෙනුවට ඥාන මාර්ය අනුගමනය කළ පිරිසක් බිහි විය.

ඒ අනුව භාරතීය චින්තාවලියේ ප්‍රථම වරට පරම ශක්තිය හෙවත් මෝක්ෂය පිළිබඳ සංකල්පය මතුවිය.

- ඇතැම් උපනිෂද් මුනිවරුන් ලෝකය හා සත්ත්වයාගේ ආරම්භය පිළිබඳ ප්‍රත්‍යවේක්ෂණ කොට ඉදිරිපත් කළ මත උපනිෂද් ග්‍රන්ථවල සඳහන් වේ.

- උපනිෂද් ග්‍රන්ථවල ආත්මවාදය ගැඹුරු දාර්ශනික වාදයක් සේ විමර්ශනයට ලක් කෙරුණි.

- පුනරුත්පත්තිවාදය හා කර්මවාදය ප්‍රථම වරට සවිස්තර ව ඉදිරිපත් කෙරුණි.

කිසියම් පුද්ගලයකු මරණින් මතු උපදින ආත්මය තීරණය වන්නේ ඔහු මෙම ආත්මයේ රැස් කර ගන්නා හොඳ නරක ක්‍රියාවලට අනුකූලව ය. වර්තමාන ආත්මය ආත්ම ගණනාවකින් සමන්විත සංසාරයේ එක් අවස්ථාවක් පමණක් බව උපනිෂද් දර්ශනයෙහි සඳහන් වේ. මෙම දාර්ශනික චින්තාවන් ගිහිගෙයින් නික්ම වනගතව තවුස්දම් පිරූ බ්‍රාහ්මණයන්ට හා ක්ෂත්‍රියන්ට පමණක් සීමා විය.

සියවස් ගණනක් තිස්සේ වැඩෙමින් ආගමික දර්ශනය තුළ ඇතැම් වෛදික දෙවිවරු වඩාත් ශක්තිමත් ව විපරිණාමයට පත් වූහ.

අන්තර්ගතය :- නන්දනී සෙනවිරත්න මිය , ලක්දාස ද මැල් විද්‍යාලය, කුරුණෑගල.
සැකසුම :- එස්. එච්. දිනුෂා හර්ෂණී කරුණාසේන මිය. ජාතික තරුණ සේවා සභාව. ( 2017-2018 )
අන්තර්ගතය පරීක්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ
Copyright © www.e-thaksalawa.moe.gov.lk

බ්‍රාහ්මණ ආරණ්‍යක උපනිෂද් ග්‍රන්ථවල සාමාන්‍ය ජනයාගේ ආගමික විශ්වාස ගැන තොරතුරු විරල ය. ඔවුන් යක්ෂ , නාග , වෘක්ෂ , සත්ත්ව වන්දනා ආදියේ දිගට ම නියැලී සිටි බව පසු කාලීන ජෛන හා බෞද්ධ ග්‍රන්ථවලින් හෙළි වේ.

බ්‍රාහ්මණයන්ගේ බිලි පූජා සහිත යාග හෝමවලින් සමන්විත ආගමික දර්ශනයට අභියෝගාත්මක ලෙස විවිධ ආගමික කණ්ඩායම් බිහි විය.
ඒ අනුව ක්‍රි.පූ 6 වන සියවස වන විට බ්‍රාහ්මණ සම්ප්‍රදාය ඉක්මවා ගිය ආගමික හා දාර්ශනික චින්තාවන් රැසක් ඉස්මතු විය.

## ඉන්දියාවේ වර්ධනය වූ නව ආගමික චින්තා

### බ්‍රාහ්මණ වාදය

බ්‍රාහ්මණ මතය අනුව සියල්ලන්ට ම අධිපති යැයි සලකන ලද්දේ මහා බ්‍රාහ්මයා ය. වේදය පහළ වූයේ ද මහා බ්‍රාහ්මයාගෙන් යැයි විශ්වාස කරන ලදී . ගුරු ශිෂ්‍ය පරපුරෙන් පරපුරට බ්‍රාහ්මණයන් විසින් වේදය පවත්වාගෙන එන ලදී.ඒ අනුව සමාජයේ ප්‍රභවය පිළිබඳ කරුණු දක්වන ලද්දේ ද වේදය අනුව ය. කාව්‍ය නාටකාදී සියලු කලාවන් , සාරධර්ම ශාස්ත්‍රයන් ද ඇතුළු උසස් හැම දෙයක ම උපත දෙවියන් බ්‍රාහ්මණයන් වෙතින් ම සිදු වී ඇතැයි සැලකීම පුරාතන භාරතීය ජනයාගේ සම්ප්‍රදාය විය. ඒ අනුව ම සමාජය ද මහා බ්‍රහ්මයාගෙන් ම උපන්නේ යැයි සලකන ලදී. කලින් කල පහළ වූ **වේද ග්‍රන්ථ සමූහය අතර වඩාත් ම පැරණි කෘතිය වන්නේ ඍග් වේදයයි**. සමාජය මහා බ්‍රහ්මයා විසින් මවන ලද ආකාරය ඍග් වේදයේ 10 වැනි මණ්ඩලයේ සඳහන් වේ.

**මහා බ්‍රහ්මයාගේ මුඛයෙන් බමුණෝ උපන්හ. බාහුවෙන් ක්ෂත්‍රියෝ පහළ වූහ. කලවයෙන් වෛශ්‍යයෝ ද දෙපතුලින් ශුද්‍රයෝ පහළ වූහ.** මූලික ආගමික සත්‍යයක ස්වරූපයෙන් බමුණන් විසින් වේදය ම ගුරු කොටගෙන සමාජ ප්‍රභවය පිළිබඳ ඉදිරිපත් කරන ලද මෙම මතය ගැන කිසිවකුටත් ප්‍රශ්න කළ හැකි නොවී ය. මහා බ්‍රහ්මයාගේ වාක්‍යය , ප්‍රකාශනය සමස්ත සමාජය විසින් ම අවිවාදයෙන් පිළිගත යුතු වූයේ ය.

මෙසේ නිර්මාණවාදී සංකල්පය මගින් ඔවුන්ට වාසිදායක සංකල්ප සමාජගත කිරීම සිදු විය. බ්‍රාහ්මණ ඉගැන්වීම් අනුව සමාජය සංවිධානය වී තිබුණි.එසේම සමාජයේ ඉහළ ම වරප්‍රසාද බ්‍රාහ්මණයන්ට හිමි වන ආකාරයට ඉගැන්වීම් ඉදිරිපත් කර තිබුණි.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය :- නන්දනී සෙනවිරත්න මිය , ලක්දාස ද මැල් විද්‍යාලය, කුරුණෑගල.
සැකසුම :- එස්. එච්. දිනුෂා හර්ෂණී කරුණාසේන මිය. ජාතික තරුණ සේවා සභාව. ( 2017-2018 )
අන්තර්ගතය පරීක්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ
Copyright © www.e-thaksalawa.moe.gov.lk

වර්ණ භේදය අනුව ආර්ථික කටයුතු සිදු විය. සමාජයේ උසස් ම ස්ථානය හිමි වූයේ බ්‍රාහ්මණයන්ට ය.ඔවුහු වරප්‍රසාද ලත් පරම පූජනීය පිරිස විය. සමාජ නියමුවන් ලෙස පෙනී සිටියේ ය.පූජකයෙකු විමට වෙනත් කවර කුලයක අයෙකුට හෝ අවසරයක් නොවී ය. එම වරප්‍රසාදය මුළුමනින් ම බමුණන් සතු වූ අතර සෙසු කුලවල ජනයා තමන්ට අවනත කර ගැනීමට ඔවුන් විසින් එය අවස්ථාවක් කර න්නා ලදී. සර්ව බලධාරී වූ සියල්ලට අධිපති වූ මහා බ්‍රහ්මයාගේ නියෝජිතයන් ලෙස ඔවුහු ක්‍රියා කළෝ ය.

සමාජයේ ජීවත් වූ උගත් පිරිස වූයේ ද බමුණන් ය. ඔවුහු රාජ්‍ය අනුශාසකයෝ ද වූහ.සමාජ අනුශාසකයෝද වූහ.බොහෝවිට ගුරුවරු ද වූහ.

ඍග් , යජුර් , සාමන් , අර්ථවන් යන වේද පිළිබඳ දැනුම බමුණන් සතු විය.ත්‍රිවේදයෙහි විශාරද බමුණා " වේදගූ " නම් වේ.

මෙසේ භාරතීය සමාජයේ උසස් ම ස්ථානය බ්‍රාහ්මණ වංශිකයෝ හිමි කරගෙන සිටියහ.

බ්‍රාහ්මණ වංශිකයෝ දේව වාක්‍යය නම් වූ වේදය ගුරු කොට ගෙන මුළු මහත් සමාජය ම සංවිධානය කළෝය.

සමාජයේ ඉහළම තලයේ රැඳුණු ඔවුහු සෙසු කුලවලට හිමි තත්ත්වයද තීරණය කොට විග්‍රහ කළෝය.

ඒ අනුව උසස් ම හිමිකම් හා වරප්‍රසාද බමුණන් වෙත ම පවරා ගන්නා ලදී.

## මනුස්මෘතියෙහි දැක්වෙන ආකාරයට , බ්‍රාහ්මණයන් විසින් සිදු කරන කාර්යයන්

1. වේදය ඉගෙන ගැනීම
2. ඉගැන්වීම
3. යාග හෝම පැවැත්වීම.
4. දන් පිළිගැනීම.

මේවායේ අයිතිය බමුණන් සතු විය.බමුණන්ගේ අනුශාසකත්වය හා සංවිධානය මෙහෙයවීම ඇතිව යාගහෝම පැවැත්වීම.

අන්තර්ගතය :- නන්දනී සෙනවිරත්න මිය , ලක්දාස ද මැල් විද්‍යාලය, කුරුණෑගල.
සැකසුම :- එස්. එච්. දිනුෂා හර්ෂණී කරුණාසේන මිය. ජාතික තරුණ සේවා සභාව. ( 2017-2018 )
අන්තර්ගතය පරීක්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ
Copyright © www.e-thaksalawa.moe.gov.lk

ශාන්ති කර්ම විශේෂයක් වූද දෙවියන්ට පූජා වශයෙන් පවත්වන ලද්දා වූ ද මෙම යාගහෝම සඳහා සිය ගණන් තිරිසන් සතුන් ද ඇතැම් විට මිනිසුන් ද මරා බිලි දුන් බව සඳහන් වේ.

**යාග හෝම**
- අශ්වමේද
- වාජපෙය
- නිරග්ගල

බමුණන්ට දන් දීම ශුද්‍රයන් හැර වෙනත් කුලවල ජනයාගේ පරම යුතුකම සේ සලකන ලදී. සිය ගණන් බමුණන් එක් කොට රජවරුන් හා වෙනත් ධනවත් ජන ප්‍රධානීන් වැනි අය විසින් මහදන් පවත්වන ලද බව බෞද්ධ සාහිත්‍යයේ ද සඳහන් වේ.

ආගමික නායකත්වයත් , ධනවත් බවත් , වංශවත් බවත් උරුම කර ගෙන සිටි බ්‍රාහ්මණ සමාජය පස්කම් සුවයෙන් පිරුණ ජීවිත ගත කළ බව ද පෙනේ. ඔවුහු සෙසු කුලවලට අඩු අයිතිවාසිකම් දුන්හ.

## ජෛනාගම

උපනිෂද් දර්ශනය බ්‍රාහ්මණයන් හා ක්ෂත්‍රියන් අතර පැතිරුණ මුල් යුගයේ උපරිම තලයේ සිටියේ බ්‍රාහ්මණයන් ය. කල් යත් ම ක්ෂත්‍රියෝ දාර්ශනික චින්තනය අතින් පෙරමුණෙහි සිටියහ.මගධය ආශ්‍රිත ප්‍රදේශවල ව්‍යාප්ත වෙමින් පැවති පරිබ්‍රාජක හා ආජීවක නිකායවලට ක්ෂත්‍රිය සහයෝගය වඩ වඩා ලැබෙන්නට විය.

උපනිෂද් ග්‍රන්ථවලින් පිළිබිඹු වන යුගය අවසාන වන විට බ්‍රාහ්මණ අභියෝග ක්ෂත්‍රිය ව්‍යාපාරයේ ප්‍රතිඵල වශයෙන් ජෛන සමය හා බුදු සමය පහළ විය.

* නිගණ්ඨ පරපුරට අයත් 24 වැනි තීර්ථංකර වූ ජෛන මහාවීර මෙහි ශාස්තෘවරයා විය.එතුමා ක්ෂත්‍රිය වංශික විය.
* උතුරු බිහාරයේ වෛශාල පුරයේ උපන් ක්ෂත්‍රිය වංශික ජෛන මහාවීර විසින් බ්‍රාහ්මණ ඉගැන්වීම්වලට මුළුමනින් ම පටහැනි දහමක් ඉදිරිපත් කරන ලදී.
* උපනිෂද් දර්ශනයෙන් මතුව තිබූ ප්‍රධාන මතවාදය වූ ආත්ම වාදය කෙරෙහි සිත මෙහෙය විය.
* සත්ත්වයා කෙරෙහි පමණක් නොව ගස් කොළන් කෙරෙහි ද සදාතනිකව පවත්නා ආත්මයක් ඇතැයි දේශනා කර ඇත.


Copyright © www.e-thaksalawa.moe.gov.lk

## ජෛන ආගමේ සඳහන් මූලික ලක්ෂණ

- යාඥා හා වෛදික ආගමික චාරිත්‍ර ප්‍රතික්ෂේප කිරීම
- දෙවියන් විශ්වාස කිරීම
- අවිහිංසාවාදය අනුගමනය කිරීම
- ශරීරයට දැඩි දුක් දීමෙන් කෙලෙස් ප්‍රහීණ කළ හැකි බව විශ්වාස කිරීම
- අහිංසාව , දානය , සත්‍ය වචනය , සොරකමින් වැළකීම , වචනයෙන් සිතෙන් හා ක්‍රියාවෙන් යුත් බ්‍රහ්ම චර්යාව , සියලු ලෞකික ආශාවන්ගෙන් ඈත්වීම යන පස් වැදෑරුම් ශික්ෂා පද අනුගමනය කිරීම.

ජෛන ශ්‍රමණයෝ තමන් සියලු ගැට බන්ධනවලින් නිදහස් බව ප්‍රකාශ කරනු සඳහා වස්ත්‍ර ඇඳීමෙන් වැළකී සිටියහ.

එහෙයින් ඔවුන් නිගණ්ඨ නමින් ප්‍රසිද්ධ විය.දිගම්බර හා ස්වේතාම්බර යනුවෙන් නිකාය දෙකක් විය.

- දිගම්බරයෝ තනිව , දෙදෙනා , තිදෙනා කාණ්ඩ වශයෙන් ඔබ මොබ සැරිසැරූහ
- ස්වේතාම්බරයෝ විශාල කාණ්ඩ වශයෙන් සැරිසැරූහ.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය :- නන්දනී සෙනවිරත්න මිය , ලක්දාස ද මැල් විද්‍යාලය, කුරුණෑගල.
සැකසුම :- එස්. එච්. දිනුෂා හර්ෂණී කරුණාසේන මිය. ජාතික තරුණ සේවා සභාව. ( 2017-2018 )
අන්තර්ගතය පරීක්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

ජෛන ශ්‍රමණයෝ සිව් වැදෑරුම් වූහ.

1. සාධු හා සාධ්වී (පහත් මට්ටමේ අය)
2. උපාධ්‍ය (ඊළඟ මට්ටම)
3. ආචාර්ය (තුන්වන තලය)
4. අරිහත්ත / තීර්ථංකර (ඉහළ ම තලයේ අය)

- අරිහත්තයෝ - විමුක්තියට බාධා කර සියලු බැඳුම්වලින් මිදුනවුන් සේ සැලකේ.
- තීර්ථංකරයෝ - සංසාර සාගරය තරණය කළවුන් සේ සැලකුණහ.

මේ කාලයේ දී තීර්ථංකර තත්ත්වයට පත්ව සිටියේ මහාවීරජින මුනිවරයා ය.

ප්‍රව්‍රජ්‍යා උත්සවය ජෛන සාධුන්ගේ හා සාධ්වින්ගේ ද ගිහි ජනතාවගේ ද සහභාගිත්වයෙන් අතිඋත්කර්ෂවත් ලෙස පැවතුණි.ප්‍රව්‍රජ්‍යා ප්‍රේක්ෂකයා තමා එදින සිට සදහට ම අත්හැර දමන අත්‍යාලංකාර ගිහි ඇඳුමෙන් සැරසී උපාධ්‍යාය හා ආචාර්යවරුන් ඉදිරියට පැමිණෙයි. ඉක්බිතිව සකල ලෞකික සම්පත්තීන්ගෙන් වෙන් වන බව හඟවනු සඳහා සැරසිලි ඇඳුම් ඉවත ලා ආධුනික කාලය ගත කිරීමට අඳන දෙකකින් පොරෝනා තුනකින් සැරසී පාත්‍රය අතට ගනියි.එදින සිට භික්ෂාවෙන් ලද දළ ආහාර අනුභව කරමින් ස්නානය , මුව දෝවනය ආදියෙන් වැළකී ඉතා දුෂ්කර ශ්‍රමණ ව්‍රතය රකියි. දිනපතා උදේ සවස තමා අතින් ශ්‍රමණ ජීවිතයට අකැප කිසිදු ආපත්තියක් සිදුවී ඇත්නම් ඒ පිළිබඳ පාපොච්චාරණය කරයි.

සාධුන්ගේ හා සාධ්වින්ගේ ශ්‍රමණ ජීවිතයේ අරමුණ වූයේ ජෛන සමයේ නිර්දිෂ්ට සම්‍යක් ඥානය , සම්‍යක් දර්ශන , පන්සිල් රැකීම  ආදියෙන් සමන්විත සම්‍යක් චාරිත්‍ර අංග සපුරා ගැනීම ය.

සියලු පූජෝත්සව ඔවුන්ට තහනම් විය.ජෛන ග්‍රන්ථ අධ්‍යයනය , භාවනාව , පන්සිල් රැකීම ඔවුන් සතු ප්‍රධාන වගකීම විය.

අන්තර්ගතය  :- නන්දනී සෙනවිරත්න මිය , ලක්දාස ද මැල් විද්‍යාලය, කුරුණෑගල.
සැකසුම  :- එස්. එච්. දිනුෂා හර්ෂණී කරුණාසේන මිය. ජාතික තරුණ සේවා සභාව. ( 2017-2018 )
අන්තර්ගතය පරීක්ෂා කිරීම  :-  ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ
Copyright © www.e-thaksalawa.moe.gov.lk

ජෛන ශ්‍රමණයන්ගේ පංචශීලයට වඩා තරමක් ලිහිල් පංචශීලයක් ගිහියන් සඳහා නිර්දිෂ්ටව තිබුණි.පාණාතිපාතා වීරමණී හෙවත් ප්‍රාණඝාතයෙන් වැළකීම , මෂාවාද වීරමණී හෙවත් මුසාවාදයෙන් වැළකීම , අදත්තාදාන වීරමණී හෙවත් නොදුන් දේ ගැනීමෙන් වැළකීම , මෛථුන වීරමණී හෙවත් මෛථුනයෙන් වැළකී සිටීම , පරිග්‍රහණ වීරමණී හෙවත් ලෞකික ආශාවන් හා සැප සම්පත් සීමා කිරීම යන ඒවා විය.

- ක්‍රි.පූ 6 වන සියවසේ දී රාජ්‍ය අනුග්‍රහය ද ලැබීම නිසා ජෛනාගමනයේ පුළුල් ව්‍යාප්තියක් සිදු විය.
- ක්‍රි.පූ 5 වන සියවස වන විට ගුජරාටයේ වලභි ස්ථානයේ ජෛන සංගායනාවක් ද පැවැත්වීම.
- පසුකාලීනව චන්ද්‍රගුප්ත මෞර්ය වැනි පාලකයන්ගේ අනුග්‍රහය ජෛනාගමට ලැබුණු බව සඳහන් වේ.
- මේ අනුව මධ්‍ය ඉන්දියාව , මාල්වා , රාජ්පුට්නා යන ප්‍රදේශවලත් දකුණු ඉන්දියාවේත් ජෛනාගම ව්‍යාප්ත වීම.
- භාගවතී සූත්‍ර , චෛතුංග සූත්‍ර , සමාවතී සූත්‍ර වැනි ජෛන සාහිත්‍ය ග්‍රන්ථ රැසක් නිර්මාණය වීම.

## බෞද්ධාගම

ගෞතම බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කළ ධර්මය බුදුදහම ලෙස හැඳින්වේ.




ශ්‍රී ලාංකික වංශකතාවලට හා බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථවලට අනුව ක්‍රි.පූ . 543 කාලයේ උතුරු ඉන්දියාවේ නේපාල දේශ සීමාවේ ශාක්‍ය රාජ්‍ය වංශයේ සුදොවුන් රජුට දාව මහමායා දේවිය කුසින් බිහි වූ සිද්ධාර්ථ කුමරු සිය ජීවිතයේ මුල් කාලයේ පියා විසින් සැකසුණු පරිසරය තුළ කාමසුඛල්ලිකානුයෝගී ජීවිතයකට හුරු පුරුදු විය. ඔහුගේ අධ්‍යාපනය ද ක්‍රමානුකූලව සංවිධානය කරනු ලැබුවකි. සිද්ධාර්ථ කුමරු කෝලීය වංශයේ කුමරියක වූ යශෝදරා හා විවාහ වී පුතකු ලැබූ දින එනම් 29 වන වියේ ගිහිගෙය ගැන කලකිරී තපස් රකිනු සඳහා පිටත් විය.

මුල් කාලයේ දී ගුරුවරුන් ලෙස ආලාර කාලාම සහ උද්දකරාමපුත්‍ර තපස්වරුන් ආශ්‍රයේ ඔවුන් දැන සිටි ධර්මය හදාරා ඇත. තව දුරටත් සත්‍ය ගවේෂණය සඳහා විවිධ ව්‍රතවල යෙදෙමින් සය අවුරුද්දක් තිස්සේ දුෂ්කර ක්‍රියාවෙහි නියලුණි. සිද්ධාර්ථ කුමරු සමග තව තපස්හු පස් දෙනෙක් සත්‍ය ගවේෂණයේ යෙදුණහ.

නොබෝ කලකින් මෙබඳු ක්‍රියාවල යෙදීම හෙවත් අත්තකිලමතානුයෝගය නිෂ්ඵල සේ වටහා ගත් සිද්ධාර්ථ තවුසා සිරුරට යැපෙන තරමට ආහාරපාන ගනිමින් මධ්‍යම ප්‍රතිපදාවේ යෙදී බුද්ධගයාවේ ඇසතු බෝ ගසක් මුලට වී රාත්‍රිය පුරා සමාධි භාවනාවෙහි යෙදී එළිවෙන යාමයේ සර්වඥතා ඥානය ලබා බුද්ධත්වයට පත් වූ බව බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වේ.

අන්තර්ගතය :- නන්දනී සෙනවිරත්න මිය , ලක්දාස ද මැල් විද්‍යාලය, කුරුණෑගල.
සැකසුම :- එස්. එච්. දිනුෂා හර්ෂණී කරුණාසේන මිය. ජාතික තරුණ සේවා සභාව. ( 2017-2018 )
අන්තර්ගතය පරීක්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ
Copyright © www.e-thaksalawa.moe.gov.lk

- එතුමා 35 වන වියේ දී බුද්ධත්වයට පත් වූහ.
- පස්වග තවුසන්ට සත්‍ය අවබෝධ කරදීම පිණිස බරණැස ඉසිපතන මිගදායේ ඔහු මුණ ගැසුණහ.
- එහිදී පස්වග මහනුන්ට **ධම්මචක්කපවත්වන සූත්‍රය** දේශනා කළහ.
- එම සූත්‍රයෙන් සිරුරට අපමණ සැප දෙන කාමසුඛල්ලිකානු යෝගය ද , සිරුරට දැඩි වෙහෙස ගෙන දෙන , පීඩාදෙන අත්තකිලමතානු යෝගය ද , ග්‍රාම්‍ය , අනාර්ය , අන්තගාම ක්‍රියා ලෙස සලකා සත්‍ය ගවේෂණයට **මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කරන ලෙස වදාළහ.**




**යනුවෙන් ආර්ය අෂ්ටාංගික මාර්ගයේ යෙදෙමින් මිනිසා නිවන් මගට යොමුව මැරී උපදින සංසාර චක්‍රය කෙළවර කළ හැකිබව උන්වහන්සේ දේශනා කළහ.**


Copyright © www.e-thaksalawa.moe.gov.lk

ධම්මචක්කපවත්වන දේශනාව ඇසූ ශ්‍රමණ පස්දෙනා මුල් ම ශ්‍රාවකයෝ බවට පත්වූහ.ඉක්බිතිව උන් වහන්සේ හමුවට පැමිණි යසකුල ප්‍රමුඛ කුල පුත්‍රයෝ 55 දෙනෙක් උන් වහන්සේගෙන් බණ අසා පැවිදි වූහ.



මෙසේ ශ්‍රාවක පිරිස 60 දෙනෙකු වූ පසු ජනතාවගේ හිතසුව පිණිස ජනපද චාරිකාවේ යෙදෙන ලෙස තම ශ්‍රාවකයන්ට උපදෙස් දුන් බුදුන් වහන්සේ ඔවුන් සමග විවිධ ජනපදවල චාරිකා කරමින් තම ධර්මය ජනතාවට බෙදා දුන්හ.

බුදුන් වහන්සේගේ දර්ශනයේ මූලික අරමුණ වූයේ සකල සත්ත්වයා සසර දුකින් මුදවා ගැනීමයි.එනම් ආර්ය සත්‍යයන් 4 කි.

1. දුක්ඛ ආර්ය සත්‍යය
2. දුක්ඛ නිරෝධ ආර්ය සත්‍ය
3. දුක්ඛ සමුදය ආර්ය සත්‍ය
4. දුක්ඛ නිරෝධ ගාමිණී ප්‍රතිපදා ආර්ය සත්‍ය

එනම් දුක , දුක ඇති වීමට හේතුව , දුක නැති කිරීම , දුක නැති කිරීමේ මාර්ගය චතුරාර්ය සත්‍ය ලෙස පෙන්වා දුන්හ.**මෙය පටිච්ච සමුප්පාදය යනුවෙන් හැඳින්විණි.**

හේතුඵල න්‍යාය අනුව කටයුතු කිරීමෙන් පුද්ගලයෙකුට අවස්ථා 4 කදී ප්‍රතිඵල ලබාගත හැකිය.එනම්,

1. සෝතාපන්න
2. සකෘදාගාමි
3. අනාගාමි
4. අර්හත්

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය :- නන්දනී සෙනවිරත්න මිය , ලක්දාස ද මැල් විද්‍යාලය, කුරුණෑගල.
සැකසුම :- එස්. එච්. දිනූෂා හර්ෂණී කරුණාසේන මිය. ජාතික තරුණ සේවා සභාව. ( 2017-2018 )
අන්තර්ගතය පරීක්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ
Copyright © www.e-thaksalawa.moe.gov.lk

මිනිසා දෙවියකු , බ්‍රහ්මයකු හෝ අන් කවරකු විසින් මවන ලද්දක් නොව , තමා ම රැස් කර ගන්නා කුසලාකුසල කර්ම මගින් ම බිහිවන්නකු බවත් එහෙයින් තම විමුක්තිය සොයා ගත යුත්තේ තමා විසින් ම බවත් බුදුහු වදාළහ.

එතෙක් මධ්‍යම ඉන්දියාවේ ආචීර්ණ කල්පිතව පැවත ආ නිර්මාණවාදය , ආත්මවාදය , භෞතිකවාදය , අක්‍රියවාදය ඇතුළු විවිධ දර්ශන වාදවලින් වෙහෙසට පත්ව සිටි චතුර් වර්ණයට අයත් නැණවතුන්ට ඒහිපස්සිකව වටහා ගත හැකි ධර්මයක් දෙසූ හෙයින් ඔවුහු ගෞතම බුදුන් වෙතට පැමිණ බුදු සමය වැළඳගත්හ. ඇතැම්හු පැවිදි වූහ.

මේ නිසා නොබෝ කලකින් ම බ්‍රාහ්මණ ආගමට හා ජෛන ආගමට වඩා බුදු සමය මධ්‍යම ඉන්දියාවේ පෙරමුණට පත්විය.

ශාසනය පොදු ජනතාව වෙත පතුරවමින් තමන් පෙන්වා දුන් ජීවිත මාර්ගයට ඔවුන් යොමු කරවනු සඳහා තම ශ්‍රාවක ශ්‍රමණයන් ඇතුළත් වූ සංඝ සමාජය උන් වහන්සේ සැලසුම් කළහ. තම ජීවිත යැපීම සඳහා භික්ෂාවෙන් හෙවත් පිඬු සිඟා ලැබෙන අහරින් සැනසී සිටීමට ඔවුනට සිදු විය. එහෙයින් ඔවුහු භික්ෂු නාමයෙන් හැඳින්විය. කල්යාමේ දී කාන්තා පක්ෂය ද උන් වහන්සේගේ ශාසනයට පිවිසෙන්නට වූයෙන් ඔවුහු භික්ෂුණී යනුවෙන් හැඳින්වූණහ. තමන්ට ම විශේෂ වූ විනය නීති යටතේ ඔවුහු හික්මුණහ.



පැවිදි ජීවිතයට ඇතුළත් නොවූ ජනතාවට ද ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ගුණ දම් සපුරා මරණින් මතු සංසාරය කෙටි කර ගත හැකි මාර්ගය බුදු දහමෙහි උගන්වන ලදී. ඒ සඳහා ඔවුන් ත්‍රිවිධ රත්නය කෙරෙහි ශ්‍රද්ධාවෙන් යුක්තව තිසරණගත උපාසක උපාසිකාවන් බවට පත්විය යුතු විය.

මේ අනුව විවිධ කුලවල විවිධ ස්තරවල ජනතාව බුදු සමය වැළඳ ගත්හ. ඉන්දියාවේ කාලාන්තරයක් තිස්සේ පැවත චතුර් වර්ණය ම වෙනුවට භික්ෂු ,භික්ෂුණී , උපාසක , උපාසිකා යනුවෙන් සිව්වනක් පිරිසක් ප්‍රථම වරට ඉන්දියාවේ පහළ විය.

බුද්ධත්වයෙන් පසු 45 වසරක් තිස්සේ විවිධ ගම් නියම් ගම් දනව්වල තම ශ්‍රාවක සංඝයා ද කැටිව ජනපද චාරිකාවේ යෙදුණු උන් වහන්සේ තම ශ්‍රාවකයන් හිමවන්ත , අපරන්ත , තක්සලා , අවන්ති , ගෝධාවරී ආදී ජනපදවල චාරිකා කර වූ බව සඳහන් වේ.



කෝසල ජනපදයේ පසේනදී රජු , මගධ රාජ්‍යයේ බිම්බිසාර , අජාසත් රජු , අනේපිඬු සිටාණන් , මහදන සිටාණන් වැනි සිටුවරු ද බුදුන් වහන්සේගේ අනුග්‍රාහකයෝ වූහ.

සංඝ සමාජය සකසා විධිමත් කොට ගිහි සමාජයට ඔවුන්ගේ සංසාර විමුක්තිය පිළිබඳ ජීවන මාර්ගය පෙන්වා දෙමින් උන් වහන්සේ අසූවන වියෙහි දී වර්තමාන උත්තර ප්‍රදේශයේ පිහිටි කුසිනාරා නුවර සාල වනෝද්‍යානයේ දී පිරිනිවන් පෑහ.

බුදු දහම කෙරෙහි ලැබුණු ජන ප්‍රසාදය හා රාජ්‍ය අනුග්‍රහය නිසා කෙටි කලකින් එය විශාල ප්‍රදේශයක ව්‍යාප්ත වී ඉන්දියාවේ රාජ්‍ය ආගම බවට ද පත් විය.

අන්තර්ගතය :- නන්දනී සෙනවිරත්න මිය , ලක්දාස ද මැල් විද්‍යාලය, කුරුණෑගල.
සැකසුම :- එස්. එච්. දිනුෂා හර්ෂණී කරුණාසේන මිය. ජාතික තරුණ සේවා සභාව. ( 2017-2018 )
අන්තර්ගතය පරීක්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ
Copyright © www.e-thaksalawa.moe.gov.lk



බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසක් ගත වූ තැන මහා කාශ්‍යප මහ රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් අජාසත් රජුගේ අනුග්‍රහයෙන් මගධයේ අගනුවර වූ රජගහ නුවරට රැස් වූ පන්සියයක් රහතන් වහන්සේ බුදුන් වහන්සේගේ දේශනා සංගායනා කොට ධර්ම විනය යන ප්‍රධාන තේමාව යටතේ පෙළ ගැස්වූහ.

එහිදී ධම්ම කොටස දීඝ , මජ්ඣිම , සංයුක්ත ,අංගුත්තර හා ඛුද්දක යනුවෙන් නිකාය 5 කට සංග්‍රහ කළ අතර විනය වෙනම පිටකයක් සේ සංග්‍රහ විය. පසුව ඛුද්දක නිකායේ ඇතැම් කොටස් සංග්‍රහ කොට අභිධර්ම පිටකය ලෙස ද නිකාය පහේ අන්තර්ගත සූත්‍ර පිටකය ලෙස ද සංග්‍රහ විය.

මෙසේ නොබෝ කලකින් බුද්ධ භාෂිතය , **සූත්‍ර පිටකය විනය පිටකය හා අභිධර්ම පිටකය** යනුවෙන් තුන් පිටකයක් සේ ව්‍යවහාර වූ අතර ඒවාට අයත් ධර්ම කාණ්ඩ මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන එන ලෙස ඒ ඒ ධර්ම කාණ්ඩවල ප්‍රවීණ ස්ථවිර කණ්ඩායම්වලට පවරන ලදී. මෙසේ පැවත ආ තුන් පිටකය ථේරවාදී තුන් පිටකය ලෙස ව්‍යවහාර විය.

ඉක්බිති බුද්ධ පරිනිර්වාණයෙන් වසර සියයක් ගත වන තෙක් සංඝයා නොබෙදී එක ම සමාජයක් ලෙස පැවත ආහ.

මගධයේ කාලාශෝක රජුගේ කාලයේ නැගෙනහිර ජනපදයේ වේසාලි භික්ෂූන් අමුතු ප්‍රතිපත්ති 10 ක් පිළිපදිමින් සිටි අතර අවන්ති ජනපදය ආශ්‍රයේ සිටි බටහිර දිග භික්ෂූහු ඊට විරුද්ධත්වය ප්‍රකාශ කළහ.



ඉක්බිතිව කාලාශෝක රජගේ අනුග්‍රහයෙන් වේසාලියේ දී රැස්වූ භික්ෂූහු බුද්ධ භාවිතය පිළිබඳ සංගායනාවක් පැවැත්වූහ. භික්ෂූන් පන්සියයක් සමන්විත වූ මේ සංගායනාවේ දී වේසාලි භික්ෂූන්ගේ ජීවිතය පිළිබඳ වූ දස වස්තුව බුද්ධ භාෂිතයට පටහැනි යැයි තර්ක කොට ප්‍රතික්ෂේප විය.

එහෙත් එම තීරණය පිළිගැනීමට අකමැති වූ වේසාලි භික්ෂූහු ථේරවාදී භික්ෂූන්ගෙන් වෙන්ව මහා සාංඝික නමින් වෙනම නිකායක් පිහිටුවා ගත්හ. මෙසේ ථේරවාදී හා මහා සාංඝික වශයෙන් බෙදී ගිය භික්ෂූන් පසු කලෙක විවිධ නිකායන් පිහිටුවා ගැනීම නිසා බුදුන් පිහිට වූ කේවල සංඝ සමාජය නිකාය 18 කට බෙදී ගියේ ය.

Copyright © www.e-thaksalawa.moe.gov.lk


Copyright © www.e-thaksalawa.moe.gov.lk

# ඉන්දියාවේ සමකාලීන නව ආගමික චින්තා....

ක්‍රි.පූ. 6 වැනි සියවස වන විට භාරතයේ බුදු සමයෙන් බැහැරව විවිධ ආගමික දෘෂ්ටි 6 ක් පැවති බව පාලි සාහිත්‍ය ග්‍රන්ථවල සඳහන් වේ.

එදා වඩාත් ප්‍රමුඛස්ථානයට පත් වූ ප්‍රධාන දෘෂ්ටි 6.

1. වර්ධමාන මහාවීර හෙවත් නිගන්ථනාතපුත්ත විසින් දේශනා කරන ලද - ජෛනධර්මය.
2. පූර්ණ කස්සප - අකිරියවාදය
3. මක්ඛලිගෝසාල - නියති සංගතිභාව
4. අජිත කේශකම්බලි -භෞතික වාදය
5. පකුධ කච්චායන -අකිරියවාදය
6. සංජය බෙල්ලට්ඨීපුත්ත -අඥෙය වාදය

## පූර්ණ කස්සප

කුසලාකුසල කිසිදු කර්මයක විපාක නොලැබෙන බව මෙන් ම උත්සහායෙන් ක්‍රියා කිරීමේ අර්ථයක් නොමැති බව ද කියවෙන අකිරියවාදි දර්ශනයක් ඉදිරිපත් කළේ ය.

සාමඤ්ඤඵල සූත්‍රයෙහි මොහුගේ ඉගැන්වීම් මෙසේ සඳහන් වෙයි.“සියතින් කරන්නාටද අනුන් ලවා කරවන්නාටද, අනුන් අත්පා සිඳින්නාටද , සිඳුවන්නාටද , අනුන් පෙළවන්නාට ද , පර පීඩාවක් කරන්නාටද , කරවන්නාටද පවක් සිදු නොවේ.

හිංසා කරමින්, කරවමින් අත්පාදිය සිඳිමින්, සිඳවමින් ගංගා නදියෙහි දකුණු තෙරට යන්නේ ද ඉන් සිදුවන පවක් නැත.ගංගා නදියෙහි උතුර තෙරට දන් දෙමින් යාග කරමින්, කරවමින් යන්නේ ද ඉන් සිදුවන පිනක් නැත.දානය , සංවරබව ,ඉන්ද්‍රිය දමනය , සත්‍ය වචනය යන මෙයිනුදු සිදුවන පිනක් නැත.

කුසලාකුසල කර්ම ප්‍රතික්ෂේප කරන මොහු අකිරිය වාදියෙකි.

අන්තර්ගතය :- නන්දනී සෙනවිරත්න මිය , ලක්දාස ද මැල් විද්‍යාලය, කුරුණෑගල.
සැකසුම :- එස්. එච්. දිනුෂා හර්ෂණී කරුණාසේන මිය. ජාතික තරුණ සේවා සභාව. ( 2017-2018 )
අන්තර්ගතය පරීක්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ
Copyright © www.e-thaksalawa.moe.gov.lk

## මක්ඛලි ගෝසාල

* උණ දඬුවක් අතැතිව සිටි නිසා මක්ඛලි ගෝසාල නම් වූ බව සඳහන් වේ.
* ඔහුගේ ඉගැන්වීම නියතිවාදයක් හෙවත් නාස්ති වාදයක් ලෙස සඳහන් වේ.
* එනම් මෙලොව සිදුවන සියලු දැ හේතු රහිතව ම සිදුවන බවත් ඒවා වෙනස් කිරීම කිසිවකුටත් නොහැකිය යන්න කියවේ.
* බුදුන් වහන්සේ මෙම දර්ශනය විවේචනයට ලක් කර එය මිනිසුන්ගේ දියුණුවට අහිතකර බව දේශනා කළහ.

## අජිත කේසකම්බල

* මොහු උච්චේදවාදී දෘෂ්ටියක් ඉදිරිපත් කරන ලදි.
* ආපෝ ,තේජෝ ,වායෝ හා පඨවි යන මූලධර්මය එක් වී සත්ත්වයා හටගන්නා බවත් මරණින් පසු ඒවා සතර මහා භූතයන්ට එක්වන බවත් ඉගැන්විය.
* මේ නිසා භෞතික වාදයක් ලෙසද එතුමාගේ ඉගැනවීම් හඳුනාගත හැකිය.

"දුන් දෙයහි පල නැත. කළ මහා යාගයෙහි පල නැත.කුසලා කුසල කර්මයන්ගේ පල විපාක නැත.මෙලොව පරලොව නැත.මවට පියාට සැලකීමේ පල විපාක නැත.මැරී නැවත උපදින සත්වයෙක් නැත.මෙලෝ පරලෝ හොඳින් දැන හැඳින පවසන නිසි මගට පිළිපන් මහණ බමුණෝ නැත....යනාදි ලෙස මොහුගේ ඉගැන්වීමේ දැක්වේ.

## පකුධ කච්චායන

* බ්‍රාහ්මණ වංශිකයකු වූ මෙතුමා මුලදී නිගණ්ඨයන් ඇසුරු කළ තීර්ථංකරයකු විය.
* අනතුරුව අකිරියවාදයක් (ශාස්වතවාදය )ඉදිරිපත් කරමින් පෘථිවිකාය, ජලකාය, අග්නිකාය , වායුකාය, සුඛදුක්ඛ කාය යන මේවා කිසිවෙකුත් නිර්මාණය නොකළ බව ඉගැන්විය.

## සංජය බෙල්ලට්ඨිපුත්ත

* ඔහු ඉගැන්වූ දර්ශනය අමරා වික්ඛෙපවාදය නම් විය.
* එනම් කිසිදු ස්ථිර පදනමක් නොමැති දර්ශනයක් ඉදිරිපත් කරමින් ලෝකය හෝ විමුක්තිය පිළිබඳ තමා ස්ථිරව කිසිවක් ප්‍රකාශ නොකරන බව සඳහන් වේ.

පරලොවක් ඇද්දැයි මගෙන් ඇසුවහොත් පරලොවත් ඇතැයි මට සිතුනොත් පරලොවක් ඇතැයි මම කියමි.එහෙත් එබඳු අදහසක් මට නැත. පරලොවක් ඇතැයි යන අදහසක් ද ඇත. පරලොවක් නැත්තේ නොවේ යන අදහසක්ද නැත.....යනා දි ලෙස පවසයි.
කවර ප්‍රශ්නයකට හෝ සථිර ඒකාංශික පිළිතුරක් නොදෙන්නෙකි.

අන්තර්ගතය :- නන්දනී සෙනවිරත්න මිය , ලක්දාස ද මැල් විද්‍යාලය, කුරුණෑගල.
සැකසුම :- එස්. එච්. දිනුෂා හර්ෂණී කරුණාසේන මිය. ජාතික තරුණ සේවා සභාව. ( 2017-2018 )
අන්තර්ගතය පරීක්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ
Copyright © www.e-thaksalawa.moe.gov.lk

## ආශ්‍රිත ග්‍රන්ථ

* ඉන්දියාවේ ඉතිහාසය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
* බුද්ධ චරිතය - දහම් පාසල් අවසාන විභාගය
* ගුරු අත්පොත - ජාතික අධ්‍යාපනය ආයතනය

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය :- නන්දනී සෙනවිරත්න මිය , ලක්දාස ද මැල් විද්‍යාලය, කුරුණෑගල.
සැකසුම :- එස්. එච්. දිනුෂා හර්ෂණී කරුණාසේන මිය. ජාතික තරුණ සේවා සභාව. ( 2017-2018 )
අන්තර්ගතය පරීක්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ
Copyright © www.e-thaksalawa.moe.gov.lk